# වෙනස් වීම වෙනස් කිරීම

රෙඩ්ෆීල්ඩ් ගේ සංකල්පවලට අනුව අද ලොකයේ මහා සම්ප්‍රදාය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙයි. ඉන් කියැවෙන්නේ ඔහුට අනුව අද අපේ ද මහා සම්ප්‍රදාය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය බව ය. රෙඩ්ෆීල්ඩ් ගේ සංකල්පය යොදා ගැනීමෙන් ඇතැමුන්ට එකල අපේ මහා සම්ප්‍රදාය භාරතීය මහා සම්ප්‍රදාය යැයි තීරණය කිරීමට හැකි විය. විශේෂයෙන් ම මහාචාර්ය සරච්චන්ද්‍ර මහතා ඇතුළු පිරිස ඒ මතයෙහි පිහිටියහ.

එහෙත් මෙයින් කියැවෙන්නේ සරච්චන්ද්‍ර මහතා රෙඩ්ෆීල්ඩ් ගේ මහා සම්ප්‍රදාය ගැන ලියූ ලිපියක් සිංහලයට පරිවර්තනය කිරීමට පෙර ඉන්දියාවට (බටහිරයන් පැමිණීමට පෙර වූ භාරතයට) ගැති වූ පිරිසක් මෙරට නො සිටි බව නො වේ. අදාළ සංකල්පය නොමැති වුව ද ඉන් ජනිත කරන මූඛ්‍ය අදහස බොහෝ විට සංගීතය, වෙදකම ආදිය ඉගෙනීමට බ්‍රිතාන්‍යීන් ගේ ඉන්දියාවට ගිය අයට තිබී ඇති බව මනාව පැහැදිලි වෙයි.

මෙයට වසර පනහකට පමණ පෙර සිටි උගත්තු බොහෝ විට එක්කෝ බටහිර ගැති වූහ. එසේත් නැත්නම් ඉන්දීය ගැති වූහ. හෙළ හවුල මෙයට විරුද්ධ වුව ද ඔවුන්ගෙන් ඇතැමෙකු මුළු මහත් ලෝකයට ම වැදගත් දැනුම් ලබා දී ඇත්තේ සිංහලයන් ය වැනි අදහසක් ප්‍රචලිත කිරීමත් සමඟ ඔවුන් ලියන කතා කරන දේ ගැන බොහෝ දෙනා සැකයෙන් බැලීමට පටන් ගත්හ. එවැනි මතවාදවලට නො යන්නට හෙළ හවුලට මෙයට වඩා දෙයක් රටේ සංස්කෘතිය ගැන කීමට හැකියාවක් තිබුණි.

සරච්චන්ද්‍ර මහතා මහා සම්ප්‍රදාය පිළිබඳ ලිපිය පළ කිරීමෙන් පසු භාරතීය සම්ප්‍රදාය අපේ සංස්කෘතික මහා සම්ප්‍රදාය ද විය. ඉන් පෙර ද තත්ත්වය එසේ ම වූ නමුත් ඒ ප්‍රකාශ කිරීම සඳහා සංකල්පයක් නො වී ය. දීන බව තහවුරු කෙරෙන සංකල්පය සරච්චන්ද්‍ර මහතා ඔස්සේ රෙඩ්ෆීල්ඩ්ගෙන් ලැබුණි. ඒ කුමක් වුවත් අපේ පැරණි ශාස්ත්‍රීය සම්ප්‍රදාය භාරතයෙන් ලැබුණු එකක් බව බොහෝ බටහිර නොවන උගතුන් ගේ මතය විය. බටහිර නොවන ඊනියා දේශීය උගත්තු බොහෝ විට දේශීයත්වය භාරතයෙන් ලබාගැනීමට උත්සාහ කළහ.

එහෙත් ඈත අතීතයේ තත්ත්වය එසේ නො වී ය. අප බොහෝ විට සඳහන් කර ඇති ආකාරයට අප බුද්ධදහම පවා ලබා ගත්තේ අපට අවශ්‍ය ආකාරයට ය. සිංහල බෞද්ධ සංස්කෘතිය යනු අපේ පැරැන්නන් නිර්මාණය කළ එකක් මිස දඹදිවින් ලබාගත් එකක් නො වී ය. බෝධි වන්දනාවේ සිට දෙවියන් සම්බන්ධයෙන් ඇති වත් පිළිවෙත් දක්වා ඇත්තේ අපේ සංස්කෘතියේ අංග මිස අශෝක රජු ගේ බෞද්ධ සංස්කෘතියේ අංග නො වේ.

අප පසු කලෙක භාරතීය සංස්කෘතිය අනුකරණය කර ඇති බව සැබෑ ය. ඒ අප ථෙරවාද බුද්ධදහම ආරක්ෂා කිරීම සඳහා නිර්මාණ නො කිරීමට තීරණය ගැනීමෙන් පසුව බව පැහැදිලි ය. එහෙත් මෙරට සංස්කෘතිය අතීතයේ දී අදීනව වැඩුණු එකක් විය. එහි දී අපට දඹදිව මහා සම්ප්‍රදායක් නො තිබුණි. අපේ පැරණි භික්ෂූන් වහන්සේලා විසින් නිර්මාණය කරන ලද ඇතැම් දාර්ශනික සංකල්ප තවමත් අප සතුව ඇත.

ඉන් එක් සංකල්පයක් මෙහි දී ගෙනහැර දක්වන්නේ දඹදිව කිසිම ගුරුකුලයකට අයත් නොවූ සංකල්ප අපට තිබූ බව පෙන්වීම සඳහා ය. ඒ වෙනස හා සම්බන්ධ විය. වෙනස් වීම් යනු කුමක් ද යන ප්‍රශ්නය අනාත්මවාදී දර්ශනයක වැදගත් වෙයි. යමක් වෙනස් වන්නේ යැයි කීමෙන් අදහස් වන්නේ කුමක් ද? වෙනස් වීම පිටුපස යමක් තිබේ ද? වෙනත් වචනවලින් කිවහොත් වෙනස්වන යමක් තිබේ ද?

වෙනස් වන යමක් තිබේ යැයි ගතහොත් ඒ වෙනස් වන්නට වෙනස් නොවන යමක් තිබිය යුතු ය. අප උදාහරණයක් වශයෙන් අහවලා පසුගිය අවුරුදු දහයක කාලයක වෙනස් වී ඇත යන ප්‍රකාශය ගනිමු. ඉන් කියැවෙන්නේ ඒ තැනැත්තා එක්කෝ උස ගොස් ඇති බව ය. එසේත් නැතිනම් ඔහු ගේ අදහස් වෙනස් වී ඇති බව ය. ඇතැම් විට ඔහු විවාහ වීම නිසා වෙනස් වන්නට ඇත. එසේත් නැතහොත් මේ ආදී කරුණු එකකට වඩා වැඩි සංඛ්‍යාවකින් ඔහු වෙනස් වන්නට ඇත.

© Prof. Nalin De Silva

ඒ කුමක් වුවත් ඉන් අදහස් වන්නේ එලෙස වෙනස් වන තැනැත්තකු සිටින බව ය. එසේ තැනැත්තකු සිටින්නේ නම් එතැන ආත්මවාදයක් ඇත. වෙනස් වීමක් තිබුණ ද, එලෙස වෙනස්වන්නෙකු හෝ වෙනස් වන්නක් ඇත. අපේ මහාවිහාරික පැරණි භිකෂුන් වහන්සේ මේ පිළිබඳ කල්පනා කිරීමේ ප්‍රතිඵලය වූයේ වෙනස්වීම යන්නෙන් කියැවෙන්න වෙනස් වීම ය. වෙනස් වන යමක් ඇති බව පිළිගැනීමට නොහැකි බව දත් උන්වහන්සේ වෙනස්වීම යන්නෙහි පැරණි අර්ථකථනය වෙනස් කර එයට වෙනත් අර්ථකථනයක් ලබා දුන් හ.

සිංහල ථෙරවාදය බෞද්ධ සම්ප්‍රදායට අනුව දෙයක් යනුවෙන් ගත හැකි කිසිවක් නැත. අපේ සිත් ගොරහැඩි බැවින් අපට ග්‍රහණය කළ හැකි අඩු ම අන්තරයක් වෙයි. මේ කාල අන්තරයකි. එසේත් නැත හොත් දිග පිළිබඳ වූ අන්තරයකි. අප කෙතරම් උත්සාහ ගත්ත ද සමහර විට අපට ප්ලෑන්ක් දිගට අඩු දිගක් මැන ගැනීමට නොහැකි වනවා ඇත. එසේත් නැත හොත් ප්ලෑන්ක් කාලයට වඩා අඩු කාලයක් ග්‍රහණය කිරීමට නොහැකි වනවා ඇත.

මෙහි දී කිව යුතු කරුණ නම් ප්ලෑන්ක් කාලය හා ප්ලෑන්ක් දිග යන්න මෙහි දී යොදා ගැනෙන්නේ ඒ මිණුම්වල විශේෂිතයක් ඇති බැවින් නො ව ඒ අප දන්නා කුඩා දිගක් නිසා බව ය. ප්ලෑන්ක් කාලය සම්බන්ධයෙන් ද එලෙස ම දැන ගත යුතු ය. අප එලෙස ප්ලෑන්ක් කාලයක් ගත්ත ද ඒ කාලයෙහි දී පවා වෙනස් නො වන්නක් පවතින්නේ යැයි ගත හැකි නො වේ. එසේ ගත හොත් අප ආත්මවාදයට හසු වෙයි. තුන්වැනි ධර්ම සංගායනාවේ දී කෂණවාදය හා ධර්මවාදය එකතු වූයේ මේ කරුණු පැහැදිලි කිරීමට යෑමේ දී ය.

ථෙරවාදයට මාධ්‍යමිකයන් ගෙන් ප්‍රහාරයක් එල්ල වූයේ කෂණවාදය හා ධර්මවාදය පිළිගැනීම හේතුවෙනි. කෂණයක පවතින ධර්මතාවක් පිළිගැනීම ආත්මවාදී බව නාගර්ජුන හාමුදුරුවෝ පෙන්වා දුන් හ. එහෙත් එයට නිසි පිළිතුරක් දීමට ථෙරවාදීහු අපොහොසත් වූ හ. අපේ පැරණි භිකෂුන් වහන්සේ ද මේ සම්බන්ධයෙන් කල්පනා කර ඇති බව පැහැදිලි ය. එහෙත් උන්වහන්සේට ද ඒ සඳහා දිය හැකි පිළිගත හැකි පිළිතුරක් නො වී ය.

එසේ වුවත් උන්වහන්සේ වෙනස් වීම යන්නට නව අර්ථකථනයක් දුන් හ. උන්වහන්සේ කියා සිටියේ වෙනස් වන යමක් නැති බවත් යමක් ඇති වී නැති වන බවත් කෙසේ හෝ ඒ ඇති වී නැති වන ධර්මතා එලෙස නො ගෙන වෙනස් වන එක් ධර්මතාවක් ලෙස ගැනීමට අප පෙලඹෙන බවත් ය. මෙය ඇතැමුන්ට තරමක් ගැටලුසහගත විය හැකි ය. එහෙත් ඉන් කියැවෙන්නේ ධර්මතා ඇති වී නැති වන බවත් ඒ ධර්මතා එසේ ඇති වී නැති වන බව තේරුම් ගැනීමට නොහැකි අප ඒ සියලු ධර්මතා එක් ධර්මතාවක් ලෙස ගෙන ඒ එක් ධර්මතාව වෙනස් වන බව තේරුම් ගන්නා බවත් ය.

අහවලා උස යන්නේ ය යන්නෙහි තේරුම උසින් වෙනස් වන අයකු සිටින බව නො වෙයි. ඒ ඒ කෂණයෙහි දී උසින් වෙනස් ධර්මතා රාශියක් ඇති වී නැති වෙයි. ඒ ඇති වී නැති වන ධර්මතා එක් ධර්මතාවක් ලෙස ගන්නා අපි ඒ එක් ධර්මතාව අහවලා ලෙස හඳුන්වා ගනිමු. හඳුන්වා දෙමු. ඒ ධර්මතාව උස යන්නේ යැයි කියමු. අපේ පැරණි භිකෂුන් වහන්සේලා මේ කරුණ ඉතා මැනවින් පැහැදිලි කර ඇත. එහෙත් උන්වහන්සේලා ද ධර්මතාව යන්න පිළිගෙන ඇති බව පැහැදිලි ය.

දැනට වසර කිහිපයකට පෙර මනස පිළිබඳ සංකල්පයක් නිර්මාණය කිරීමේ දී අපට අපේ සම්ප්‍රදායේ ඇති මේ අදහස් ඉතා වැදගත් විය. අපට මනස යන්න ඇති වී නැති වන චිත්ත පරම්පරාවක් ඇසුරෙන් නිර්මාණය කර ගන්නා දෙයක් බව තේරුම් ගැනීමට හැකි වූයේ අපේ සම්ප්‍රදායේ එවැනි අදහස් මහාවිහාරික භිකෂුන් වහන්සේලා අතර තිබූ බැවිනි. එහෙත් අපට ප්‍රශ්න කිහිපයක් ඉතිරි වී තිබුණි. ඒ ඒ ධර්මතාව යනු කුමක් ද? ඒ ඒ ධර්මතා අතර සම්බන්ධයක් ගොඩනැගෙන්නේ කෙසේ ද?

මේ ඇතැම් ප්‍රශ්නවලට සිංහල බෞද්ධ මනස නමින් ඇති ලිපියෙහි පිළිතුරු දී ඇත. කාලය වෙබ් අඩවියෙන් මේ ලිපිය සොයා ගත හැකි ය. ධර්මතාවකින් ධර්මතාවකට තොරතුරු ලැබෙන බවත් ඒ තොරතුරු ද ධර්මතා දෙකක් අතර වෙනස් වන බවත් අපි පෙන්නුම් කෙළෙමු. මනස යනු කුමක් ද යන ප්‍රශ්නයට අප දුන් පිළිතුර වූයේ මනස ද නිර්මාණයක් බවත් ඒ නිර්මාණය කෙරෙන්නේ ද මනස විසින් ම බවත් ය.

© Prof. Nalin De Silva

මේ ඒ පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් කිරීමට සුදුසු තැන නො වේ. සිංහල බෞද්ධ මනස යන ලිපිය හා ඉන් පසුව ලියැවුණු වෙනත් ලිපි කියවීමෙන් ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වෙයි. එහෙත් තවමත් ඒ පිළිතුරෙහි අඩුපාඩු ඇති බව අපි පිළිගනිමු. ඒ කෙසේ වෙතත් මනස යනු කුමක් ද යන ප්‍රශ්නයට අප පිළිතුරු දුන්නේ අපේ සම්ප්‍රදායේ ය. එනම් මහාවිහාරික සම්ප්‍රදායෙහි ය. අපි ඒ පිළිතුර දීම සඳහා ජ්නියා භාරතීය මහා සම්ප්‍රදායකට නො ගියෙමු. අපට අවශ්‍ය අමුද්‍රව්‍ය අපේ ම මහාවිහාරික සම්ප්‍රදායේ විය. අපි මහාවිහාරික සම්ප්‍රදායේ වෙමු.

එහෙත් අද අපි දීනයෝ වෙමු. අපි කෙතරම් දුරට මහා සම්ප්‍රදාය ආදී සංකල්පවලින් මත්කර ලැබ සිටිමු ද යන්න අවබෝධ වන්නේ ඇතැම් පඬියන් ථෙරවාදය ඉවත දමා මහායානයට ගෞරව කිරීමට දරන උත්සාහයේ දී ය. මේ පඬියන්ට අනුව දර්ශනය ඇත්තේ මහායනයේ මිස ථෙරවාදයේ නො වේ. ඔවුන්ට ථෙරවාදය මහායානය තරම් ගැඹුරු දහමක් නො වේ. එහෙත් සෑම මහායානික ගුරු කුලයක් ම අවසානයේ දී ආත්මවාදී වන බව මේ පඬියෝ තේරුම් නො ගනිති.

බටහිර දැනුම අතනින් මෙතනින් අහුලාගෙන බටහිරට ආවඩන දීන අනුකාරක උගත්තු මෙන් ම මේ ජ්නියා දේශීය උගත්තු ද භාරතයෙන් කරුණක් දෙකක් අහුලා ගෙන භාරතයට ආවඩති. අපේ මහාවිහාරික සම්ප්‍රදාය වෙනුවට භාරතයේ ජ්නියා මහා සම්ප්‍රදායක් පසුපස යෑමට මොවුහු පුරුදු වී සිටිති. වෙනස් වීම පිළිබඳව මා දන්නා හොඳ ම අදහස් නිර්මාණය වී ඇත්තේ මහාවිහාරික භික්ෂූන් වහන්සේලා අතිනි. එහි දී වත්මන් බටහිර භෞතික විද්‍යාවේ අදහස් ළදරුවන් ගේ බහ තේරීමකට වැඩි දෙයක් නො වන බව කිව හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva